# ජාතක කතාව හා රංග චිකිත්සාව පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

කේ.ඩී. චමිලා වීරසිංහ

# <u>හැඳින්වීම</u>

රංග චිකිත්සාව අනුව ජාතක කතා මිනිස් සිත විනිවිද දැක ඇති ආකාරය බලන විට එය කවර යුගයකට වුවද ගැලපෙන බව පැහැදිලිය. මන්ද රංග චිකිත්සාව යනු නාට්‍යයක් නොව පුද්ගලයා මුහුණ දෙන ගැටළුව විපරිවර්තනීය තත්ත්වයට පත්කර ගැනීමට ඔහුගේ මනෝභාවයන්ට ප්‍රකාශනයක් ලබාදීමට අවස්ථාවක් සැලසීමයි.

ජාතක කතාව දිගහැරෙමින් කියා පාන්නේ මිනිසා මුහුණ පා ඇති අනන්ත ප්‍රශ්ණ සමූහය සඳහා වන මනෝ චිකිත්සාවයි.

මැත යුගයේදී අනවර්තයෙන් සිදුවන වෙනස්වීම් සනාතන ධර්මතාවක් වුවද එය පෙර නුදුටු විරූ සීඝ්‍රතාවයකින් යුක්තව සිදුවන බවට කිව හැකිය. මිනිසාට මානසික රෝග වැළදෙන්නේ කෙලෙස් නිසාය. කවර ආගමකට ජාතිකයකට අයත් වුවත් කෙළෙස්වල ස්වභාවය පොදුය. ඒ නිසා කවරයම්ම ජන කොටසකට අයත් වුවත් මානසික රෝගී සෑම මිනිසාටම සුවය අත්කර දීමේ හැකියාව බෞද්ධ මනෝ චිකිත්සාවේ ඇත. මිනිසා මානසික රෝගියෙකු කරන ක්ලේෂ ධර්ම බෞද්ධ මනෝ චිකිත්සාවට හසුවෙයි. ජාතක පොතෙහිවන මනෝ චිකිත්සාව විශ්ලේෂණය සෑම මිනිසාටම පොදු වූවකි.

මෙය රංග චිකිත්සාවේ පැහැදිලි කරන ආකාරයට කිසිවෙකුට රෝගියෙකු වන්න අවශ්‍ය නැත යන්න පැහැදිලි වේ. රංග චිකිත්සාව තුල පූර්ණ මිනිසා අත්දකින්න උත්සාහ නොකලහොත් චිකිත්සාව අසාර්ථක වේ. සාර්ථක වන්නේ සංස්කෘතික එළඹුමක් සහිත වූ විටය. අධ්‍යාත්මික ශක්තීන් වල ඉගැන්වීම් එහි සම්බන්ධ වේ. කාල් යුංගේ මනෝ විශ්ලේෂණවාදය මෙහිදී න්‍යායාත්මක පසුබිමක් සපයයි. මනෝ විශ්ලේෂණවාදී අවබෝධය රංග චිකිත්සකයාට ඉතා වැදගත් වේ. චික්සාව ප්‍රේමණීය කර්තව්‍යයකි. රංගනය මිනිසාගේ සිතිවිලි, ආකල්ප, මනෝභාව ආත්මයට බලපෑම් කරයි. මිනිසා වින්දිත තත්ත්වයට පත්වූවිට චිත්තවේග හා චර්යාවන් සමග විශාල පොර බැදීමක් කරයි. උපතින් පසු සමාජගතවන ආකාරය චර්යාවට බලපානු ලබයි. තවද මිනිසා ආත්මීය ලෝකය හා භෞතික ලෝකය අතර ගැටේ. ඉපදුනු දරුවා මාස 10 පමණ සිට රංගන කුසලතා පෙන්වීමට පටන් ගනී. විපරිවර්තනීය මාධ්‍යයක් වූ මෙය මිනිසාට තමන්ව යලි සොයාගැනීමට සහාය වීම සිදුවේ. එහිදී රංග චිකිත්සාවේ භාවිත විවිධ දේ උපකාරී වේ. කොන්ස්ටන්ටින් ස්ටැනිස් ලව්ස්කි ගේ Magic if උපමා රූපමා රූපක රංග න්‍යාය. එක් අවස්ථාවක භාෂාව නොමැති තැන චිකිත්සාව වඩා සාර්ථක වන ආකාරය ඉන් මනාව පැහැදිලි වේ. මේ ආකාරයට ජාතක කථාව තුළ මතුවන රංග චිකිත්සාමය ස්වභාවය, ගුණය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක් ඉදිරිපත්කර ඇත. එහිදී මාතෘකාවට අදාල සාහිත්‍යය විවරණය, ක්‍රමවේදය ජාතක කථාව තුළ ඇති රංග චිකිත්සාමය ලක්ෂණ ඇතුලත් කොට ඇති අතර අවසාන ඡේදවල මාතෘකාවලට අදාල නිගමන හා යෝජනාත් සමාලෝචනයත්, ආශ්‍රිත ග්‍රන්ථත් ඇතුළත්කර ඇත.

# පළමු පරිච්ඡේදය ඃ චිකිත්සාව

චිකිත්සාව ඈත ඉතිහාසයක් හිමි විෂය ක්ෂේත්‍රයක් බව, ක්‍රියාවලියක් බව ඒ පිළිබඳ අධ්‍යනයේදී පැහැදිලි වේ. මිනිසුන් තම ඇත්දැකීම්, දැනුම, බාහිර පරිසරය ආදී කරුණු පාදක කොටගෙන එකිනෙකාගේ ගැටළු විසදාගැනීමට සහාය වී ඇත. ඒ අතර පිළිගත් ක්‍රමවේදයක් නොතිබුණද චිකිත්සාමය ලක්ෂණ එහි විද්‍යාමාන වේ. ලෝක සම්භවය පිළිබඳව සඳහන්වන බෞද්ධ සූත්‍ර, දේශන තුළින් වෛදික සාහිත්‍යයෙන් ඊට අදාල සාක්ෂි සොයාගත හැකිය. එකල සමාජය මිනිසා රෝගාබාධ සහ දුක් කම්කටොළු නිවාරණය කරගැනීම සඳහා ඖෂධ ප්‍රතිකාර වලට වඩා අභිචාරමය චිකිත්සා ක්‍රම කෙරෙහි දැඩි අවධානය යොමු කළබව පෙන්. නිදසුන් ලෙස ඍග්වේදයේ එන ස්තුති ගීතිකා, අතර්වන් වේදයේ එන මන්ත්‍ර ආදිය පෙන්වාදිය හැකිය.

මිනිසා පිළිබඳ බුදුන් වහන්සේගේ අර්ථකථනය වන්නේ සියලු පාථග්ජන මිනිසුන් පරම සත්‍යයෙහි ස්වභාවය අවබෝධකර ගැනීමේහි මද වූ බුද්ධිය ඇත්තෝ බවත්, එම නිසා ඔවුන් ගැටළු රාශියකට මැදිවී ඇති බවත්ය. බුදු දහම සඳහන් කරන්නේ ගැටළුව සහ විසඳුම පුද්ගලයා තුලම පවතින බවය. බුදු දහමේ උත්සාහය වන්නේ ගැටළුවේදී අවශ්‍ය විසඳුම ඉස්මතුකරවා අවබෝධ කරදීමටය. ඒ සඳහා වු ක්‍රම සහ විධි රාශියකි. ත්‍රිපිටක සාහිත්‍යය විමසන විට ගැටළු විසඳූ ක්‍රම අතර සාකච්ඡා සහ වෙනත් ක්‍රම බොහොමයක් සාකච්ඡා කරයි. ඒ අතර භාවනාව ප්‍රධාන තැනක් ගනී.

ලෝකයේ බොහෝ රටවල පැවති අභිචාර විධි පිළිබඳ අධ්‍යයනය කිරීමේදී ඒවායේ පදනම මානසික ආතතී හා බැදි මනෝ ප්‍රතිකාර ක්‍රමවේදයක් වශයෙන් දීර්ඝකාලීනව පැවත එන බව පැහැදිලි වේ. බුදු දහමත් සමඟ ඇති වූ වර්තමානයේදී ද දක්නට ලැබෙන බෝධි පූජා පිරිත, බෞද්ධ ක්‍රම අතර මනෝ ප්‍රතිකාර වේ. මේ ආකාරයෙන් ක්‍රමෝපායන් අතර විවිධත්වයක් පැවතුනද ඒවායේ අරමුණු අතර යම් සමානත්වයක් පවතින බව පැහැදිලි වේ. බුදු දහමෙහි දැක්වෙන එම අරමුණු අතර,

01. විපත්ති දුරුකර ගැනීම.
02. සියලු දුක් දුරුකර ගැනීම.
03. සියලු භය දුරුකර ගැනීම.
04. සියලු රෝග දුරුකර ගැනීම.
05. සියලු සම්පත් ලබාගැනීම, ප්‍රධාන අරමුණු ලෙස හඳුනාගත හැකිය.

කෙසේ වුව චිකිත්සක ක්‍රියාවලිය ඇත අතීතයට දිව යන්නකි. නූතන උපදේශනය සුවිශේෂී න්‍යායයන්ගෙන් හා ක්‍රම වේදයන්ගෙන් සන්නද්ධ වෙමින් වඩාත් වැදගත් ක්ෂේත්‍රයක් බවට පත්වී ඇත. මේ අතර රංග චිකිත්සාව සුවිශේෂත්වය එය ප්‍රායෝගිකව භාවිතයේදී මනාව පැහැදිලි වේ.

මෙහිදී චිකිත්සකයා සතු ගුණාංග පැහැදිලි කරගත යුතුය. එනම්,

- පළමුව තම ගැටළු විසදාගත් අයෙකු විය යුතුය.
- අන් අයගේ ගැටළුව හදුනාගතහැකි වීම.
- මනා දැනුමක් අවබෝධයක් තිබීම.
- සත්‍ය යථාර්ථය අවබෝධකර කටයුතු කරනු අයෙකු වීම.
- මනුෂයත්වයට ආදරය කරන අයෙකු වීම.
- මිනිසුන් වෙත කරුණාවෙන් කටයුතු කිරිම.
- ලාභාපේක්ෂාවෙන් තොරවීම.
- තමා ද අනුන් ද නොතලා තටයුතු කළ හැකි අයෙකු වීම.
- මනා පෞරුෂයක් ඇති අයෙකු වීම.
- න්‍යාය ශිල්ප ක්‍රම කුසලතා වලින් පූර්ණ වීම.
- ආචාර ධර්ම පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීම.

එමෙන්ම රංග චිකිත්සාව භාවිතයට පෙර සේවා ලාභියා සම්බන්ධව ගත්විට,

- සේවා ලාභියා මනාව හඳුනාගැනීම.
- බාහිර ලක්ෂණ වලින් යම් දුරකට ගැටලුවේ ස්වභාවය හඳුනාගැනීම.
- සේවා ලාභියා කැම බීම ගෙන පහසුවෙන්ද සොයා බැලීම.
- චිකිත්සාව සඳහා සුදුසු පරිසරයක් තෝරා ගැනීම.
- වේලාව, සම්පත් පිළිබඳ අවබෝධය ඇතිකර ගැනීම.
- සේවා ලාභීයාගේ වයස, අත්දැකීම්, දැනුම පිළිබඳ අවබෝධයක් සැලකිල්ලක් ඇතිකර ගැනීම.
- රෝග බීජ හොඳින් හඳුනාගෙන ගැටළුව නිරාකරණය සඳහා හොඳින් සැලසුම් සකස් කිරීම.
- චිකිත්සාමය  ක්‍රියාවලිය සඳහා නිවැරදිව ප්‍රවේශ වීම.

තව දුරටත් චිකිත්සකයා සතු ගුණාංග හා කුසලතා විග්‍රහකරන විට

- භාෂණ ශක්තියක් තිබිය යුතුබව
- ඇහුම්කන්දීමේ හැකියාව
- ගැටළුව හොඳින් අවබෝධකරගැනීමේ හැකියාව
- සිතේ ධාරණය කැගැනීමේ හැකියාව
- දැනුම
- සදාචාරාත්මක බව
- කලහාකරුවෙකු නොවීම.
- නිවැරදි මඟපෙන්වන්නෙකු වීම.

මෙහිදී පුද්ගලයා හා ලෝකය පිළිබඳ ඇතිකරගන්නා නිවැරදි සංජානනය ඉතා අවශ්‍ය වේ. මෙහිදී භාෂාව මෙන්ම සංස්කෘතිය පිළිබඳ මනා අවබෝධයෙන් කටයුතු කිරීම ඉතාමත් අවශ්‍යය. සැබෑ ලෙසම ඇති දෙයක් කතා කිරීම, වර්තමානයට වටිනාකමක් ඇතිවන අයුරින් කතා කිරීම. පිළිගතහැකි දෙයක් කතා කිරීම, කාලයට ගැලපෙන ලෙෂ කතා කිරීම, අවශ්‍ය වේ.

මේ ආකාරයට සුවිශේෂතා අවශ්‍යවන්නේ රංග චිකිත්සාව චිකිත්සාවක් ලෙස ප්‍රායෝගික වීමටයි. ගැටළුවට මුහුණපාන ගැටළුව තුල ජීවත්වන පුද්ගලයාට තම මානසික ගැටළුවට හේතුව දැකීම දුෂ්කරය. එමෙන්ම වරද වරද ලෙසත් නිවැරදි දේ නිවැරදි ලෙසත් නොදකී. බෞද්ධ උපදේශනයේ සඳහන් වන්නේ පාථග්ජන සියළු මිනිසුන් මෙයට අයත්වන බවය. එයට හේතු ලෙස සඳහන් වනනේ ඔවුන්ට මොහොතක් හෝ චෛතසික වශයෙන් නීරෝගීව සිටීමට නොහැකි බැවිණි. නිරන්තරයෙන් මිනිසා බාහිර අරමුණු සමඟ ඇලීම හෝ ගැටීම සිදුකරයි. ඒ නිසාම මානසික වශයෙන් පීඩාවට වේදනාට පත්වේ. මේ ආකාරයට ගැටළු නිසා සිහිනොමුලාවට පත්නොවී එය රැකගැනීම සඳහා නැවත වතාවක් සාමාන්‍ය ජීවතයට ඒමට චිකිත්සාව වැදගත් වේ.

# දෙවන පරිච්ඡේදය : මානසික ගැටළු

මානසික ගැටළු සංජානනය අනුව සකස් වී ඇත. සංජානනය කරන ආකාරය අනුව විවිධ ස්ථර වලට පුද්ගලයා අයත් වේ. පුද්ගලයා හා සමාජය අතර පවතින යහපත් සබඳතා බිඳ වැටීම සියළු ගැටලු සඳහා මුල සාධකය වී ඇත. වර්තමාන සමාජය පරිවර්තනයක ප්‍රතිඵලයකි. එය විග්‍රහකරගත් විට සරල සමාජය සංකීර්ණ වීම, ස්වයංපෝෂික බව පරායක්ත වීම, සහයෝගීබව තරඟකාරිත්වයට භාජනය වීම, කණ්ඩායම් ජීවන නිපුණතා, තනි පුද්ගල ජීවන ක්‍රමයට හුරුවීම, ග්‍රාමීය ජීවන ක්‍රමය නාගරික ජීවන ක්‍රමයට පෙරළීම විස්තීර්ණ පවුල, න්‍යෂ්ටික පවුල බවට වෙනස්වීම, සාමූහික වැඩ ක්‍රමය කුලී ක්‍රමය බවට පත්වීම, පොදු වැඩවලට වූ ප්‍රමුඛතාවය, පෞද්ගලික වැඩ වලට ලබාදීම, අධ්‍යාත්මික බැඳීම වාණිජමය බැඳීමකට සීමාවීම පැහැදිලිව හඳුනාගත හැකිය.

පරිවර්තනය තුල සමාජය මුහුණ දී ඇති අභියෝග බොහෝමයකි. ඒ අතර,

- වේගවත් නාගරිකරණය,
- කාර්මීකරණය
- තාක්ෂණික අපයෝජන
- තනි පුද්ගලකරණය
- සමාජ පරිවර්තනය
- සමාජ ප්‍රශ්න වර්ධනය කිහිපයකි.

වර්ධනය වූ සමාජ ප්‍රශ්න අතර,

- පවුලේ ගැටළු
- නිධන්ගත රෝග
- අධ්‍යාපන ගැටළු
- සියදිවි නසා ගැනීම
- මත් ද්‍රව්‍ය භාවිතය
- අපරාධ හා ප්‍රචණ්ඩත්වය
- ළමා අපයෝජන
- යැපුම් මානසිකත්වය
- වැඩිහිටි ජනහනය වැඩිවීම
- කායික හා මානසික ආබාධිත බව, කිහිපයකි.

බෞද්ධ දර්ශනය විග්‍රහයෙහි ද සිගාලෝවාද, වසල, ව්‍යග්ගපජ්ජ, පරාභව, මංගල, සල්ලේඛ,සබ්බාසව, වත්ථූපම, ගිරිමානන්ද යන සූත්‍රවල මිනිසා මුහුණ දෙන මානසික ගැටළු හා එයට හේතු සඳහන්කර ඇත. පුද්ගලයා හා ලෝකයේ වෙනස්වීම් නිරන්තරයෙන් සිදුවන ආකාරය පැහැදිලි කර ඇත. දුක නම් පංචස්කන්ධය බව දේශනා කළ සේක. එය නිතර වෙනස්වන බවත්, ආත්මීය වශයෙන් ගතහැකි කිසිවක් නොමැති බවත්, එහෙයින් එය දුකට හේතුවන බවත්, විවිධ දේශනා මඟින් පැහැදිලි කොට තිබෙන අතර, එසේ නිත්‍ය වශයෙන් ගැනීම මුලාවක් බවත් දේශනා කළ සේක. ඒවා ඉතා අපූරු උපමා රූපක මඟින් පෙන්වා දී ඇත.

## තුන්වන පරිච්ඡේදය ඃ ජාතක කතාව හා රංග චිකිත්සාව

ජාතක කතා පොත දෙස බලන විට එය මනස පිළිබඳ ගැඹුරු දර්ශනයක් හෙලි කරන්නකි. මිනිසා පිළිබඳ විග්‍රයෙහිදී කායික මෙන්ම මානසික ක්ෂේත්‍ර දෙකෙහිම එකතුව පිළිබඳ කතා කළද ප්‍රධාන ස්ථානය මනසට ලබා දී ඇත. මනසේ අතිශය සියුම් සංකීර්ණ ස්වභාවය පෙන්වා දී ඇත. ඒ පිළිබඳ සාකච්ඡා කොට ඇත. මනෝ චිකිත්සාව යනු මනෝ ප්‍රතිකාරයයි. මනෝ චිකිත්සාවේදී සිදුවන්නේ යම්කිසි මානසික රෝගයක් හෝ මානසික ගැටළුකාරී තත්ත්වය දුරු කිරීම සඳහා උපදේශන ක්‍රියාවලියකි. එහිදී සිදුවන සුවිශේෂී ක්‍රියාවන් කිහිපයක් නම්,

- සත්‍යය අවබෝධ වීමට සැලැස්වීම
- විසඳුම් සඳහා විකල්ප තෝරා එය ක්‍රියාත්මක කිරිම.
- වැරදි ආකල්ප බණ්ඩනය කිරීම.
- චර්යාව වෙනස් කිරීම
- නිවැරදි ආකල්ප ඇතිකරවීම.
- මානසික අධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීම.
- ගැටළුව විසඳීම.

ලෝක සෞඛ්‍ය සංවිධානය සෞඛ්‍ය යන්න කුමක්දැයි යන්නට අර්ථ දක්වා ඇත්තේ, පුද්ගලයාගේ කායික, මානසික, සාමාජීය, හා අධ්‍යාත්මික යහ පැවැත්මයි. එයින් අදහස් වන්නේ හුදෙක් ලෙඩරෝග වලින් තොරවීම පමණක් නොවේ. මෙහි යහපැවැත්ම යනු තමන්ටත්, අනුන්ටත් කරදරයක් නැති ජීවන රටාවයි. සෞඛ්‍යයේ කාර්යය විය යුත්තේ එය සංවර්ධනය කිරීමය. මනස පිළිබඳ අධ්‍යාත්මය ගැන ගැඹුරු දර්ශනයක් හෙළි කරන ජාතක කථා ඇතැම් ලේඛකයින් ක්ෂේත්‍ර 4කට බෙදා දක්වයි. එනම්,

- පාර භෞතික විද්‍යාව
- ලෝක විභාගය
- ඥාන විභාගය
- ආචාර ධර්ම, නියෝජනය කරන බවයි.

හැම කතාවකම තර්ක බුද්ධියට ගෝචරවන චින්තන රටාවක් දිස්වේ. මනුෂ්‍ය චිත්ත සන්තානයේ සැඟවී පවත්නා සියුම් භාවයන් හෙළිදක්වයි. මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහයන්ගේ අදහස වන්නේ මනෝ විශ්ලේෂණය ආරම්භ වන්නේ ජාතක කතා කරුගෙන් බවයි. ජාතක කතා තුල ඇත්තේ දෘෂ්ඨියකි. කාමය, ඊර්ෂ්‍යාව, තෘෂ්ණාව, මමත්වය, ව්‍යාපාදය, පරපීඩකබව, කුහකත්වය, ආදී කෙළෙස් වලට සිත ආකරයකි. ගුථ බව එකම පුද්ගලයා තුල පවතින අභ්‍යන්තර මානසික ගැටළු

ප්‍රතිවිරෝධතා පිළිබිඹු කරයි. කතා දිග ශැරෙන්නේ හේතුඵලවාදී ඒකාබද්ධතාව මාර්ග දෙකක් පැහැදිලි කරමිණි.

01. බෞද්ධ ඉගැන්වීම් පදනම් කොටගත් සංසාරික පුරුදු, කර්ම ශක්තිය ලුහුබැඳ ඒමේ හේතුඵලවාදී චිනතනය

02. ව්‍යවහාරිකව පවත්නා සම්මුති සත්‍යයට අදාල ලෞකික වස්තූන් හා මානසික ගැටුම් පිළිබඳ අන්‍යෝන්‍ය ඒකාබද්ධතාවයෙන් යුත් සිදුවීම් තවත් සිදුවීම් වලට තුඩුදීම වශයෙන් පවත්නා ඒකාබද්ධතාවයයි.

හැම කතාවකටම සැලැස්මක් ඇත. එය අංග 5කින් යුක්තය.

01. පච්චුප්පන්න වත්ථු

02. අතීත වත්ථු

03. ගාථා

04. වෙය්‍යාකරණ

05. චරිත සමෝධානය, යනුවෙනි.

රංග චිකිත්සාවේ ද මෙයම නොවූවද මෙවැනි ගලායාමක් ඇත. එම රංග චිකිත්සා රාමුව පහත ආකාරයට වේ.

| | | | |
|---|---|---|---|
| 01. | Check in | - | චික්ත්සාව දියත් කිරීමට අවශ්‍ය ආම්පන්න තීරණය කිරීම. |
| 02. | Warm up | - | සේවා ලාභියාගේ ශරීරය සැහැල්ලු කරමින් සැසියට සූදානම් කිරීම. |
| 03. | derole | - | ආරෝපනය කරගත් භූමිකාවෙන් ඉවත්ව සංවාදයට යොමුවීම. |
| 04. | closure activity | - | ක්‍රියාවකින්, සාකච්ඡාවකින්, ගීතයකින්, සැසිය අවසන් කිරීම. |

රංග චිකිත්සාවේ භාවිතාවන විවිධ මෙවලම්, ආම්පන්න, ක්‍රමවේදයන්, ජාතක කතා තුළ ඇතුලත්ව ඇත. මුලින්ම චික්ත්සකයාට සිහිවන්නේ රංග චිකිත්සාවේ එන කතාන්දර ගොඩනැගීමය. ඉතාමත්

රසවත් හරවත්, කතාන්දර පන්සිය හතලිස් හතක් ජාතක කතා පොතෙහි ඇතුලත් වේ. එමෙන්ම කැඩපත් කරණය මානසිකව කතා දිගහැරීම තුල සිදුවේ. තමන්ගේ කතාව සේ දැනෙන්නට පටන් ගනී. ඒත් සමඟම පරිපරකල්පනය ඒ තුළ සිදුවේ. ඒ තුළ ඇඟීම, අනුකරණය, විචිත්‍රවත්බව, භූමිකා රංගනය, ක්ෂණික නිර්මාණ, සංචලනය, සැහැල්ලුකරණය, අභිරූපනය, යානාදී රංග චිකිත්සා මෙවලම් අපුරුවට ජාතක කතාකරු භාවිතාකර ඇත. එමෙන්ම එහි එන විවිධ චරිත කතාවතුළ ජීවත් වන්නා වෙසේ මුහුණු බවට පරිවර්තනය කරගන්නවා පමණක් නොව ඒ තුළින් තමාව දකී. වෙස් මුහුණු සමග නිහඬ අරගලයක් කරමින් තමාව තේරුම ගන්න උත්සාහ කරයි. තමාගේ දුර්වලකම්, තමාගේ ශක්තීන්, තමන්ට ඇති සම්පත්, තමන්ට ඇති බාධාවන්, අවබෝධකරගන්න උත්සාහ කරයි. තම පෞරුෂය සකස්කරගන්න වෙර දරයි. තවද ජාතක කතාව තුල එන වර්තමාන හා අතීත කතාව සමෝදනය කිරීම මඟින් මිනිසුන් සැනසුම් සුසුම් හෙලීම සිත සැහැල්ලුකරගැනීම සිහිගන්වන්නේ රංග චිකිත්සාවේ සිදුකරන රංග චිකිත්සක දූරස්කරන භූමිකාවයි. මෙම ක්‍රමවේදයේදී කතන්දර, විවිධ ද්‍රව්‍ය, පින්තූර, ඡායාරූප, වෙස්මුහුණ, රූකඩ, මපට්, පපට්, චිත්‍ර කලාව, වැලි තැටි, ආදිය භාවිතා වේ.

මේවා භාවිතය මගින් විවිධ ආකාරයේ ගැටළු වලට මුහුණ දුන් වින්දිතයින් දුරස් කරන ක්‍රමවේදය භාවිතයෙන් යලි ඔහුගේම පරිකල්පනය තුළින් පෙරසිටි යහපත් තත්ත්වයට පත්කිරීමේ මූලික කටයුත්ත සිදුවේ. මෙයින් වර්තමාන කම්පනකාරී අත්දැකීම මගහැරී ජීවිතයේ නව අර්ථ මතුකරගැනීමට හා එම අර්ථ පිළිබඳ නැවත සිතා බලන්නට අවකාශ සලසයි. ගැටළු හා සම්මුඛ වන්න අවශ්‍ය ශක්තිය සපයයි. යතාර්ථය දකින්න සේවා ලාභියා සූදානම් කරයි. වාස්තවික අවධියට එළඹෙයි. එවිට අඩු දුරස්කරන අවස්ථාව භාවිතයෙන් තමන් පිළිබඳ ගැඹුරු අවබෝධයකට එයි. භාවයන් ශක්තිමත් වේ. ජීවිතය පිළිබඳ නව මානයකින් බලයි. විකල්ප තෝරාගනී. පුද්ගලාරෝපනය තුළ තමන්ද වගකිව යුතුබව, ගැටළුවෙන් මිදෙන්න, අභිප්‍රේරණය, ආත්මසාක්ෂාත්කරණය විමසන්නට පෙළඹීම, යුක්තිසහගතබව, කෘතඥතාවය හා උපකාරය ලබාගැනීම. සැමවිටම සත්‍ය ප්‍රකාශ කිරීම යන ගුණාංග තුලජීවත්වීමට උත්සාහ ගනී.

ජාතක කතාවල පාත්‍ර වර්ගයාද රංග මෙවලම් සිහි ගන්වයි. එහි මිනිසුන් මෙන්ම පක්ෂීන්, සිවුපාවුන්, ආශ්‍රය වී ඇත. ඒ අනුව සමස්ත දත්ව ලෝකයට විෂය ක්ෂේත්‍රය වී ඇති බව පැහැදිලි වේ. සතුන් මඟින් ඔවුනට මානුෂීය ගුණදහම් ආරෝපණයකොට විසිතුරු අන්දමින් ඒ ඒ කරුණු විවරණය කරයි. එමඟින් මනුෂ්‍ය සමාජයේ විද්‍යාමාන චිරන්තන සාර්ධර්ම ඉදිරිපත් කරමින් වින්දනයක්ද ලබා දෙයි. ඔවුන්ගේ අභ්‍යන්තර ගති ලක්ෂණ මනෝ විද්‍යානුකුලව ඉදිරිපත්කරන අතර බාහිර වශයෙන් ඔවුන්ට සම්බන්ධ, චාරිත්‍ර වාරිත්‍ර, සිතුම් පැතුම්, ඇඳහිලි, විශ්වාස, විග්‍රහයට භාජනය වේ. රංග චිකිත්සාවේ ක්‍රමවේදයන් තුළ මේ කැළඹීම සිදුවේ. සෑම ජාතක කතාවකම මෙය හඳුනාගත හැකිය. ඒ අතරින් කිහිපයක් විග්‍රහකරගන්නේ නම්, චුල්ලපලෝභන ජාතකය කාමආවේගෙය නිසා මිනිසෙකුගේ අභ්‍යන්තරයේ පුපුරායන පීඩනය විස්තරය කරයි. ගිනිකන්දකට

උපමාකොට ඇත. ෆ්‍රොයිඩ් ලිබිඩෝ ශක්තිය විස්තර කිරීමේදී මෙය පැහැදිලි කරන්නේ සහජ ජීව ප්‍රේරණයක් වන ආකාරයයි. චුල්ල ධර්මපාල ජාතකයේ පුතා මරණ රජු ලිංගික ඊර්ෂ්‍යාව මනාව පැහැදිලි කරයි. මිනිසා තුල සැඟව ඇති සත්ව ගති ශිෂ්ට ගති ඉක්මවා එළියට එන ආකාරය පැහැදිලි කරයි. අසාත මන්ත්‍ර, බක, තක්කාරිය, නළිනි, පරණකප, වන්නුපථ, කපෝතක, යන ජාතක කතා ද තවත් නිදසුන් කිහිපයකි. සියලු කතාවන් තුළ ඇති චිකිත්සාමය ගුණය රංග ස්වභාවයෙන් එළි දැක්වේ. මේ අකාරයෙන් මිනිසාගේ භාවික හා බුද්ධිමය සාඵල්‍යයත්, අඩුපාඩුකම් හා දුර්වලකම් හෙළිකරීම, එහිදී මානව චින්තනයේ ගැඹුරු තැන් හා සංකීර්ණ ගුඩ ස්වභාවයත් විවිධ චරිත මතුපිටින් පෙනෙනවාට වඩා ගුප්ත ආකාරකින් ක්‍රියා කිරීම ආදී විවිධ ගැඹුරු ජීවිත ප්‍රශ්න විග්‍රහ කිරීම අතින් විශ්ව සම්භව්‍ය සාහිත්‍යයේ උසස් ම තැනක් හිමිකර ගනී. ජාතක කතා පොත පරිශීලනය කරන පාඨකයා, දුර්ලභ ජීවිත පරිඥානයක් මේ නිසා ලබයි. සැලකිල්ලෙන් කියවීමෙන් වසර ගණනාවක් ජිවත් වූ අයෙකු මෙන් අත්දැකීමක් ලබයි. මෙහි එන මානව චරිතාංග කාලයාගේ ඇවෑමෙන් කිසිවිටෙකත් අභාවයට නොයයි. කිසිම කලෙක කිසිම දේශයකදී, අවලංගු නොවන්නා වූ යුගයෙන් යුගය, යතාර්ථයට සමීප වන්නා වූ සිද්ධීන්ගෙන් ගහන වූ සදාතනික වටිනාකමකින් යුතු නිර්මාණ මංජුසාවකි.

# සමාලෝචනය

මෙම අධ්‍යයනයේ අවශ්‍යතාවය වූයේ ජාතික කතාවෙහි කොතරම් දුරට රංග චිකිත්සාව හඳුනාගත හැකි ද යන්න විමසා බැලීමය. රංග චිකිත්සාවේදී සිදුවන්නේ පුද්ගලයාට තමාවෙත තමාගේ ඇතුලාන්තය වෙත එබී බලන්නට, එහි ගිලී ඇතුලාන්තට පිරික්සන්නට ඉඩ හසර ලබාදීමය. ඒතුලින් තමාගේ පෞරුෂ වර්ධනයට මඟපාදා දී පසුතැවිලි නොවන අයෙකු මෙන්ම හිංසාකාරී නොවන අයෙකු මෙන්ම, වැඩදායක චරිතයක් බවට, සකස් වන්නට, උදව් කිරීමය. ඒ සඳහා විවිධ මෙවලම් භාවිතා කරයි.

වර්තමාන සමාජය ගත්විට රංග චිකිත්සනීය මෙවලම් භාවිතයේ අවශ්‍යතාවය මතු වී ඇත. මන්ද මිනිසුන් මුහුණ දෙනු ලබන විවිධ සමාජ ප්‍රශ්ණ නිසා ඔවුන් වෙහෙසට පීඩාවට පත්ව ඇත. රංග චිකිත්සාවේදී මිනිසාගේ භාවිත හා බුද්ධිමය සාඵල්‍යයත්, අඩුපාඩුකම් හා දුබලකම් හෙලිකිරීම එහිදී මානව චින්තනයේ ගැඹුරු තැන් හා සංකීර්ණ ගුඨ ස්වභාවයත්, ගැඹුරු ජීවිත ප්‍රශ්න විග්‍රහ කිරීමත් සිදුවේ. ආකල්ප වෙනස්වීම ඒ මඟින් සිදුවන විට ඔවුන් සැහැල්ලු ශක්තිමත් පිරිස් බවට පැහැදිලි වේ. මනුෂ්‍යත්වය තුළ මිනිසුන් බලාපොරොත්තු වන්නේ සාමය, මානව හිතවාදය, මිත්‍රත්වය, පුද්ගල ගෞරවය. එය ආරක්ෂා වන්නේ ඔවුනොවුන් පිළිබඳ මනා අවබෝධයක් පැවතුන හොත් පමණි. ඒ සඳහා අවශ්‍ය මූලික ගුණාංගය නම් මානව සමාජ සම්බන්ධතාය. මෙහිදී සමාජයට අනුකූල ලෙස ජීවත්වීමට හුරුකරවන ක්‍රියාවලිය වන සමාජානුයෝජනය මෙහිදී වැදගත් වේ. බිඳුණු සබඳතා ගොඩනගන්නට රංග චිකිත්සාව ඉතා හොඳින් මැදිහත් වේ. ජාතක කතා සාහිත්‍යයේ ඉතා ආකර්ෂණීය ලෙස යහපත් මිනිසුන් වන්නට, සමාජයක් ගොඩනගන්නට, කරුණු ඉදිරිපත් කොට ඇත. සාහිත්‍යාංගයක් වුව, එය මනෝ ප්‍රතිකාර ඇතුලත් ක්‍රියාදාමයකි. පීඩාවන්ට හේතුව බුදු දහමෙහි සඳහන්වන පංචනීවරණ ධර්ම බව මෙහි හුවා දක්වයි. රංග චිකිත්සාව විචිත්‍ර වූවකි. ජාතක කතාවද ඉතා ශ්‍රේෂ්ට චිත්‍රයකි. ඒතුළ සමාන කමක් නොවූවද යම් සමානකම් තිබීමත්, යම් සමීපකම් තිබීමත්, නිසා ජාතක කතා තුළ රංග චිකිත්සා ලක්ෂණ අධ්‍යයනයට පෙළඹවීමක් විය. සාන්ද්‍රෂ්ඨිකවාදී මනෝ විද්‍යාඥයෙක් වන වික්ටර් ෆ්‍රැන්කල්ට අනුව බොහෝ මානසික රෝග ඇති වන්නේ මිනිසාගේ පැවැත්ම හා සම්බන්ධ ගැටළු පදනම් කරගෙනය. එහෙයින් මිනිසා හා ලෝකය ජීවිතය පිළිබඳව යථා තත්ත්වය නිවැරදිව අවබෝධකරගැනීම අසාමාන්‍ය චර්යාවන්ගෙන් පුද්ගලයා මුදවා ගැනීම සඳහා මෙය කදිම ක්‍රමවේදයක් බව ඔහුගේ අදහසයි. මේ පිළිබඳව නිවැරදි අවබෝධයක් නොමැති වීමෙන්, පුද්ගලයා යතාර්ථයෙන් ඈත්වන බව ඔහුගේ අදහසයි. මිනිසා සරල ජීවිතයකට හුරු නොවීමත්, ලද දෙයින් සතුටු නොවීමත්, අනුකරණශීලීවන්නේ අනවබෝධය නිසා බව ඔහු කියයි.

වර්තමානයේ උඩු යටිකුරු වී ඇති සමාජ ක්‍රමයේ ජීවත්වන මිනිසුන්ට අවශ්‍ය වන්නේ චිකිත්සාමය මැදිහත්වීමකි. රංග චිකිත්සාව මෙහිදී වැදගත් වන්නේ එහි ඇති චිකිත්සාමය ගුණය නිසාය.

## ආශ්‍රිත ග්‍රන්ථ


01. හේවා මානගේ විමල්, *බෞද්ධ ස්වස්ථතාව රෝග නිවාරණය සහ චිකිත්සාව,* සමයවර්ධන මුද්‍රණ ශිල්පියෝ, 2008.

02. මහාචාර්ය ගල්මංගොඩ සුමනපාල, *බෞද්ධ භාවනා ක්‍රම හා මනෝචිකිත්සාව,* සරස්වතී ප්‍රකාශණ, 2006.

03. වික්‍රමසිංහ මාර්ටින්, *ජාතක කතා විමසුම,* සරස ප්‍රකාශකයෝ, 2002.

04. මහාචාර්ය රත්නපාල නන්දසේන, *ජාතක කතා සංග්‍රහය*, රත්න පොත් ප්‍රකාශකයෝ.

05. රණසිංහ රවීන්ද්‍ර, *මනෝ උපදේශන පසුබිමෙහි රංග චිකිත්සාව*, හරේ ප්‍රින්ටර්ස්, 2013.

06. ආචාර්ය පාතේගම ඥානරාම හිමි, *ජාතක කතා සාහිත්‍ය විමර්ශනය,* බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 1980.

07. මනෝ වෛද්‍ය හරිස්චන්ද්‍ර ඩී.වී.ජේ, *Phychiatric Aspects Of Jathaka Stories*, 1998.

08. මහාචාර්ය එදිරිසිංහ දයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හපුආරච්චි, *කාල් රොජර්ස් සහ නූතන මනෝ විද්‍යාව,* වත්මා ප්‍රකාශකයෝ, 2016.